S. Thomas’ College – Gurutalawa     SINGHALA MEDIUM

# Divinity

**Gread 7**                                                                 **Time : 2 hours**

- **වඩාත්ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. දෙවියන් වහන්සේ තමා මවා වදාල සියලු දේ නරඹා ...................... බව දුටු සේක. හිස්තැනට සුදුසු වචනය වන්නේ,
    1. අසම්පූර්ණ   2. අපිළිවෙල   3. ඉතා මනහර   4. අක්‍රමවත්

02. මරියතුමිය තම දෙමාපියන් සමග ජීවත් වූයේ,
    1. කානා නුවර   2. ගලීලයේ නාසරෙත් නුවර
    3. මිසරයේ   4. බෙත්ලෙහෙමේ

03. ජේසුස් වහන්සේගේ උපත දේවදූතයන් මුලින්ම දැනුම් දෙනු ලැබුවේ,
    1. එඬේරුන්ටය.   2. ශාස්ත්‍රවන්තයින්ටය
    3. පූජකයන්ටය.   4. රජවරුන්ටය.

04. ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් උපදින බව බයිබලයේ පවසා සිටියේ,
    1. ජාකොබ්ගේ නුවරිනි.   2. දාවිත්ගේ නුවරිනි.
    3. මෝසෙස්ගේ නුවරිනි   4. එලියාගේ නුවරිනි.

05. ජේසුස් වහන්සේට කුරුසිය ගෙන යාමට උදව් වූයේ,
    1. යහපත් සමාරිතයාය.   2. කිරේනියේ සීමොන්ය.
    3. අරමාතියේ ජෝසෙප්ය.   4. සාකෙවුස්ය.

06. ජේසුස් වහන්සේගේ මෘත ශරීරය තැන්පත් කිරීම සඳහා ඉල්ලා ගත්තේ,
    1. යහපත් සමාරිතයාය.   2. කිරේනියේ සීමොන්ය
    3. අරමාතියේ ජෝසෙප්ය   4. සාකෙවුස්ය.

07. ජේසුස් වහන්සේගේ පුනරුත්ථානය තුළින් අපට උරුම වන්නේ,
    1. සදාතන ජීවනයයි. 2. ඒදන් උයනයයි.   3. දේව මාලිගයයි.   4. පාපයට කමාවයි.

08. පැරණි ජුදෙව් සමාජය තම පාපයට කමා ලැබීම උදෙසා දෙවිඳුන්ට පූජාකළේ,
    1. පරවි පැටවෙකි.   2. කොටළු පැටවෙකි.
    3. වසු පැටවෙකි.   4. බැටළු පැටවෙකි.

09. ස්නාවක ජොහාන් තුමා ජනතාවට බෞතිස්මය ලබා දුන්නේ,
    1. තිබේරියස් මුහුදෙහි ගිල්වීමෙනි.   2. නයිල් ගඟේ ගිල්වීමෙනි.
    3. ජෝර්දාන් ගඟේ ගිල්වීමෙනි.   4. රතු මුහුදෙහි ගිල්වීමෙනි.

10. ජේසුස් වහන්සේ පාළුකරයේදී පරීක්ෂාවන්ට මුහුණ දුන්නේ,
    1. දින 40 ක් මුළුල්ලේය.   2. දින 7 ක් මුළුල්ලේය.
    3. දින 3 ක් මුළුල්ලේය.   4. දින 50 ක් මුළුල්ලේය.

11. ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වූයේ උත්ථානයෙන්,
    1. දින 40 කට පසුවය.   2. දින 7 කට පසුවය.
    3. දින 3 කට පසුවය.   4. දින 50 කට පසුවය.

12. ජේසුස් වහන්සේගේ සුභාරංචි පණිවුඩය සමාරිය කරා ගෙනගියේ,
    1. සීමොන්ය.    2. ජුදස්ය.    3. ස්තේපන්ය.    4. පිලිප්ය.

13. මුල් කිතුනු සභාවේ හෙවත් ජෙරුසලම් සභාවේ නායකයා වූයේ,
    1. සීමොන්ය.    2. ජුදස්ය.    3. ස්තේපන්ය.    4. පිල්ප්ය.

14. එතියෝපිය පුද්ගලයා කියවමින් සිටියේ බයිබලයේ,
    1. නික්මයාම පොතයි.    2. ගීතාවලිය පොතයි.
    3. යෙසායා පොතයි.    4. උත්පත්ති පොතයි.

15. මාගේ අසල්වැසියා කවුරුන්ද යන විනයධරයා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු ලෙස ජේසුස් වහන්සේ පැවසුවේ,
    1. අබ ඇටයේ උපමාව    2. යහපත් සමාරිතයාගේ උපමාව
    3. අකීකරු පුත්‍රයාගේ උපමාව    4. නැතිවූ කාසිය පිළිබඳ උපමාව

(15 × 2 = 30)

## II කොටස

**සියලුම ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

01. දෙවියන් වහන්සේ විසින් ඉර , සඳ, තරු මවන ලද්දේ කී වෙනි දවසේදී ද? ..........................................

02. මරියතුමියට ජේසු උපත පිළිබඳව සුභාරංචි ගෙනා දේව දූතයා නම් කරන්න. ............................................

03. ජේසුස් වහන්සේගේ හිසට ඉහළින් කුරුසියේ ගසා තිබූ චෝදනා පත්‍රයේ ලියා තිබුණේ කුමක්ද?

..........................................................................................................................................

04. ජේසුස් වහන්සේව කුරුසියේ ඇණ ගසන ලද්දේ කොහේදීද? ..................................................................

05. කිතුනු පාස්කුව ලෙස අප හඳුන්වන්නේ කුමක්ද? ..........................................................................

06. ජේසුස් වහන්සේ උපත ලැබුවේ කොහේදීද? ..........................................................................

07. ජේසු කුමරු හැදී වැඩුනේ කොහේද? ..........................................................................

08. ජේසුස් වහන්සේ යක්ෂ පරීක්ෂාවලට පිළිතුරු ලබාදුන් ශුද්ධ ලියවිලි පාඨ අඩංගුව තිබුණේ බයිබලයේ පැරණි ගිවිසුමේ කුමන පොතේද?

..........................................................................

09. සුභාරංචි පැතිරවීමට අමතරව පිලිප් වෙත පැවරී තිබුණු එක් කාර්යයක් ලියන්න.

..........................................................................

10. .අනේ ගුරු දේවයිනි මට පෙනීම ලබාදෙන්න. ලෙස කියා ඇදහිල්ලෙන් පෙනීම ලැබුවේ කවුද?

..........................................................................

(10 × 2 = 20)

## III කොටස

ප්‍රශ්න **5 කට** පමණක් පිළිතුරු සපයන්න.

01. 1. ස්නාවක ජොහාන්ගේ දෙමාපියන් නම් කරන්න.
    2. ජේසුස් වහන්සේගේ බෞතීස්මයේදී ස්වර්ගයෙන් නික්මුණු වචන ලියන්න.
    3. ජේසුස් වහන්සේ මුහුණදුන් පරීක්ෂාවන් 3 ට උන්වහන්සේ ලබාදුන් පිළිතුරු 3 ලියන්න. (බයිබලයේ සඳහන් ආකාරයට) (2, 3, 5)

02. 1. ඒලි ඒලි ලාමා සබක්තානි යන ප්‍රකාශනයේ අර්ථය ලියන්න.
    2. ජේසුස් වහන්සේගේ කුරුසිය පාමුල සිට උන්වහන්සේට කවටකම්කළ කොටස් 3 ක් ලියන්න.
    3. ජේසුස් වහන්සේ කුරුසි පත්වුණේ අපේ පව් උදෙසාය. එම කුරුසි පත්වීමට අදාළ විශේෂ අවස්ථා 5 ක් ලියන්න. (2, 3, 5)

03. 1. ස්වාමින්ගේ යාච්ඤාව තුළ අප පරීක්ෂාවෙන් මිදීම සඳහා කෙරෙන ඉල්ලීම සඳහන් වන්නේ කෙසේද?
    2. ජේසුස් වහන්සේගේ උත්ථානයේ සුභාරංචිය අන් අය වෙත ගෙනයාම සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ග 3 ක් ලියන්න.
    3. ඔබගේ පාපයට දෙවිඳුන්ගෙන් කමාව අයදමින් යාච්ඤාවක් ලියන්න. (2, 3, 5)

04. 1. ජේසුස් වහන්සේගේ සොහොන වෙත ගිය කාන්තාවන් 2 ක් ලියන්න.
    2. දේවමාලිගය කඩා දමා එය තුන් දවසකින් ගොඩනගන බව කීමෙන් ජේසුස් වහන්සේ අදහස් කළේ කුමක්ද?
    3. එම්මාවුස් ගමන ගිය ගෝලයන් ජේසුස් වහන්සේව හඳුනාගත්තේ කෙසේද? (2, 3, 5)

05. 1. උපස්ථායකයින් සත්දෙනෙකු මුළු කිතුනු සභාවට තෝරා කරගත්තේ ඇයිදැයි කරුණු 2 ක් ලියන්න.
    2. දේව දරුවකු වශයෙන් ඔබ තුළ තිබෙන යහපත් ගුණාංග 3 ක් ලියන්න.
    3. දෙවියන් වහන්සේ විසින් මවන ලද සතුන්ගෙන් මිනිසාට ලබාගත හැකි ප්‍රයෝජන 5 ක් ලියන්න. (2, 3, 5)

06. 1. යහපත් සමාරිතයාගේ උපමාවෙන් ලබාගත හැකි ආදර්ශ 2 ක් ලියන්න.
    2. අකීකරු පුත්‍රයාගේ කථාවෙන් අපට ලබාගත හැකි පාඩම් 3 ක් ලියන්න.
    3. කමාවීම පිළිබඳ ස්වාමින් වහන්සේගේ යාච්ඤාවේ සඳහන් වන්නේ කෙසේදැයි ලියන්න. (2, 3, 5)